---

මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව
අනුරාධපුර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මැයි 09 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 අප්‍රේල් 20 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශිය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

මූල්‍ය ප්‍රකාශනවල පැවති ගිණුම්කරණ අඩුපාඩු හා එමගින් මූල්‍ය ප්‍රකාශනවලට සිදුවී ඇති බලපෑම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | අඩුපාඩුවේ ස්වභාවය | විෂයයන් ගණන | ආදායම් | වියදම් | වත්කම් | වගකීම් |
|---|---|---|---|---|---|---|
| | | | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දැක්වීම් | 01 | 04 | - | - | - |
| (ආ). | මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දැක්වීම් | 01 | - | 61 | - | - |
| | - එම - | 01 | - | - | - | 61 |
| | - එම - | 01 | 665 | - | - | - |
| (ඇ). | මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරීම් | 01 | - | - | - | 77 |

---

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | - එම - | 03 | - | - | 936 | - |
| | - එම - | 01 | ගණනය කර නැත | - | - | - |
| (ඈ). | මුල්‍ය ප්‍රකාශනවල අනුචිත හෙළිදරව් කිරීම් | 01 | - | - | 145 | - |
| | - එම - | 01 | - | - | - | 75 |

### 1.3.2 නොසැසඳු ගිණුම්

මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 04 කට අදාල ශේෂයන්ගේ එකතුව රු.27,294,647 ක් වු අතර, උපයෝගි ලේඛන/ වාර්තා අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.20,653,447 ක් විය.

### 1.3.3 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබු ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.102,472 ක් විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.7,185,982 ක් වු ගිණුම් විෂයයන් 07 ක් විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය /සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.5 අනුකුල නොවීම්

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි විධිවිධානවලට වලට අනුකුල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකුල නොවීම |
|---|---|---|
| (අ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත | |
| | 153 වගන්තිය | මසකට රු.50,000 ක් ඉක්මවන ඉදිකිරීම් කටයුත්තක් හෝ භාණ්ඩ හා සේවා සැපයුමක් සඳහා වූ ගෙවීමක් වෙනුවෙන් 5% ක රඳවා ගැනීමේ බද්දක් අය කර ගත යුතු වුවත් අවස්ථා 12 කදී |

---

කරන ලද රු.2,276,877 ක ගෙවීම් වෙනුවෙන් අය කළ යුතු රු.113,843 ක බදු මුදල් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති

168 (i) — ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඊලඟ වර්ෂයේ මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් , සභාව විසින් 2010 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුනේ 2011 මැයි 09 වන දිනය.

(ඇ). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

(i). මුදල් රෙගුලාසි 396(ඇ) — නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවු රු.53,794 ක් වටිනා චෙක්පත් 02 සම්බන්ධයෙන් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවු ආදායම රු.3,443,641 ක් වු අතර, ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.700,938 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා ,හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i). | වරිපනම් හා බදු | - | - | - | - | - | - |
| (ii). | බදු කුලී | 1,313 | 972 | 352 | 790 | - | 791 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 2,108 | 1,853 | - | 2,556 | 730 | 1,826 |
| (iv) | වෙනත් ආදායම් | 7,982 | 933 | 5,704 | 8,410 | 2,996 | 3,939 |

### 2.2.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥාපනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු.3,960,174 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

### 2.2.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.196,756 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

### 2.2.4 වරිපනම් බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන ප්‍රකාශයට පත් කර එම ප්‍රදේශ ඇතුළත පිහිටි නිශ්චල දේපලවලින් වරිපනම් බදු අය කිරීමට පියවර ගෙන නොතිබුණි.

### 2.2.5 කඩ කාමර බදු

(i). පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රාදේශීය සභාව සතු කඩ කාමර මාසික කුලිය ප්‍රධාන තක්සේරුකරුගේ හෝ පළාත් පාලන සේවයට අයත් තක්සේරුකරුගේ තක්සේරුව සලකා බලා තීරණය කළ යුතු අතර, යටත් පිරිසෙයින් වර්ෂ 05 කට වරක් තක්සේරු බදු කුලිය සංශෝධනය කළ යුතු වුවද, ප්‍රාදේශීය සභාවට අයත් කඩ කාමර 18 ක මාසික බදු කුලිය වර්ෂ 10 කට පෙර තීරණය කර තිබුණු කුලිය මත පදනම්ව අය කර තිබුණි.

(ii). සභාව සතු පණ්ඩුලගම කඩ කාමර 09 කින් 2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ කුලිය රු.336,636 ක්වූ අතර එම හිඟ කුලිය අය කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

### 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමග පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| පුනරාවර්තන වියදම් | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පෞද්ගලික පඩිනඩි | 9,977 | 8,566 | 1,411 | 9,637 | 6,982 | 2,655 |
| අනෙකුත් | 3,757 | 3,785 | (28) | 4,485 | 4,970 | (485) |
| උප එකතුව | 13,734 | 12,351 | 1,383 | 14,122 | 11,952 | 2,170 |
| ප්‍රාග්ධන වියදම | 38,200 | 47,357 | (9,157) | 56,650 | 30,335 | 26,315 |
| මුළු එකතුව | 51,934 | 59,708 | (7,774) | 70,772 | 42,287 | 28,485 |

### 2.4 මානව සම්පත් කළමනාකරණය

#### 2.4.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

(අ). 2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|---|
| (i). | මාණ්ඩලික | 01 | 01 |
| (ii). | ද්විතීක | 04 | 05 |
| (iii). | ප්‍රාථමික | 15 | 17 |
| (iv). | වෙනත් (අනියම්,තාවකාලික) | - | 06 |
| | එකතුව | 20 | 29 |

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සීමාව ඉක්මවා නිලධාරීන් 09 දෙනෙකු බඳවා ගෙන සහා අරමුදලින් සමාලෝචිත වර්ෂය තුල වැටුප් හා දීමනා ලෙස රු.1,218,384 ක් ගෙවා තිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

### 2.5.1 නිෂ්ක්‍රිය භෞතික සම්පත්

උතුරු මැද පළාතේ ප්‍රධාන අමාත්‍යාංශය විසින් සහල් පිටි ආශ්‍රිත බේකරි නිෂ්පාදන ව්‍යාපාතියක් ආරම්භ කිරිම සඳහා 2008 වර්ෂය තුළදී රු.814,000 ක් වටිනා යන්ත්‍ර සහ උපකරණ ලබාදී තිබුණු නමුත් එම ව්‍යාපෘතිය 2010 දෙසැම්බර් 31 වන විටත් ආරම්භ කර නොතිබීම නිසා එම යන්ත්‍ර සහ උපකරණ නිෂ්කාර්යව පැවතුණි.

### 2.5.2 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.10,752,184 ක්වූ අතර අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබු ගිණුම් ශේෂයන්හි එකතුව රු.6,931,863 ක් විය.

### 2.5.3 අය වීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අය විය යුතුව තිබුණු සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.488,461 ක් වූ අතර අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවිම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.142,060 ක් විය.

2.5.4 අචල ජංගම වත්කම් .

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අචලව පවතින වත්කම් වල අගය රු.254,166 ක් විය.

2.5.5 සමීක්ෂණය නොකළ වත්කම්

සමික්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවු 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලු වත්කම්වල වටිනාකම රු.5,504,272 ක් විය.

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

ආදායම් පරිපාලක නිළධාරින් දෙදෙනෙකු විසින් 2006 වර්ෂයේදී ක්ෂේත්‍රයේදී එකතුකරන ලද රු.10,277 ක මුදලක් 2010 දෙසැම්බර් 31 වන විටත් බැංකුවේ තැන්පත් කර නොතිබුණි.එම මුදලට අදාල වගකිව යුතු නිලධාරීන් හදුනා ගෙන මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.7 කාර්ය සාධනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ පහසුව, සුභසාධනයට අදාල කාර්යයන් හා සෞඛ්‍ය, මංමාවත් හා පොදු උපයෝගි සේවාවන්ට අදාල කාර්යයන් ඉටු කිරීම සඳහා ඉදිරි වර්ෂවල ක්‍රියාකාරීත්වයට අදාල සැලසුම් ඇතුළත් සංයුක්ත සැලැස්මක් හා එම සැලැස්මේ සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීම සඳහා ක්‍රියාකාර සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

2.8 කොන්ත්‍රාත් පරිපාලනය

2.8.1 ඉදිකිරීම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

---

(අ). 2009 පළාත් සභා ප්‍රාදේශීය සංවර්ධන වැඩ සටහන යටතේ සභාවේ වැට, ගේට්ටුව හා ගරාජය ඉදිකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත් සමිතියක් වෙත 2009 දෙසැම්බර් 07 දින රු.1,915,463 ක් ගෙවා තිබුණි. මෙහි පැති තාප්පය බැඳීම වෙනුවෙන් ඇස්තමේන්තු ගත මුදල රු.99,220 ක් විය.2011 මාර්තු 10 දින ක්ෂේත්‍ර පරික්ෂාවේදී තාප්පයේ වම් පස විශාල ප්‍රමාණයේ පිපිරුම් 05 ක් හා දකුණු පස පිපිරුම් ස්ථාන 09 ක් දක්නට ලැබුණු අතර මුළු තාප්පය සඳහා දරන ලද රු.99,220 ක මුදල නිශ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය.

(ආ). පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් පරික්ෂා කර නිකුත් කරන ලද තත්ත්ව පාලන වාර්තා අනුව අසතුටුදායක වූ පහත සඳහන් කර්මාන්ත නැවත නිවැරදි කිරීමකින් තොරව වැඩ විෂයන් සඳහා ගෙවීම් කර තිබුණි.

| | කර්මාන්තය | ඇස්තමේන්තුගත මුදල | අසතුටුදායක බවට දක්වා තිබු වැඩ විෂයයේ වටිනාකම | | තත්ව පාලන වාර්තා අනුව නිරීක්ෂණය |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | | |
| (i). | නවෝදාගම අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 991,764 | 54,988 | i. | මාර්ගයේ බොරළු ඝනකම අසතුටුදායකයි |
| (ii). | කොක්කිච්චිය දිගනේගම මාර්ගය බොරළු යොදා වැඩිදියුණු කර තාර දැමීම | 514,941 | 21,133 | i. | මාර්ගය තැලීම අසතුටුදායකයි. |
| | | | | ii. | බොරළු ඝනකම අසතුටුදායකයි. |
| (iii). | මහ විලච්චිය වසමේ අතුරු මාර්ගය කොන්ක්‍රීට් | 994,379 | 18,400 | | මාර්ගය ඝනකම අසතුටුදායකයි. |

| | | | | |
|---|---|---|---|---|
| | කිර්ම. | | | |
| (iv). | ගම්බිර්ගස්වැව කොක්පිටියාව මාර්ගය තාර යෙදීම. | 621,822 | - | i. මාර්ගය තැලීම අසතුටුදායකයි.<br>ii. අවසාන මීටර් 100 බොරළු ඝනකම අසතුටුදායකයි. |

2.9 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

3. පද්ධති හා පාලන.

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය.
(ආ) ආදායම් පරිපාලනය.
(ඇ) වත්කම් කළමනාකරණය.
(ඈ) ණයගැති පාලනය.